දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )
postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )

මගේ අංකය )
எனது இல )
My No. ) 01/ SA/02/2020

ඔබේ අංකය )
உமது இல )
Your No. )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

දිනය )
திகதி ) 2022.12.15
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල / ජාතික රෝහල මහනුවර
සියළුම රෝහල් අධ්‍යක්ෂවරු / වෛද්‍ය අධිකාරීවරු
සියළුම විශේෂ සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් / විශේෂ ව්‍යාපාර ප්‍රධානීන්

**හෙද නිලධාරීන්ගේ තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් විශේෂ දැනුම්දීමයි**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස ප්‍රකාශ කරමින්, වෛද්‍ය රොහාන් ගුණවර්ධන, වෛද්‍ය අල්විස් සහ වෛද්‍ය ඩීන් යන නම්වලින් හඳුන්වා ගත් යම් පුද්ගලයකු විසින් රජයේ රෝහල්වලට දුරකථනය මගින් අමතා ස්ථානමාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා හෙද නිලධාරිණියන්ගේ පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටින බව අප වෙත වාර්තා වී ඇත.

02. මෙම අමාත්‍යාංශය විසින් නිසි බලධාරියෙකුගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හොත් මිස, එසේ කිසිදු නිලධාරියෙකුගේ තොරතුරු කිසිම පුද්ගලයකු වෙත ලබා දීමට කටයුතු නොකළ යුතු බව කාරුණිකව අවධාරණය කරමි.

03. එසේම, මෙසේ තොරතුරු ඉල්ලා සිටින වංචනික පුද්ගලයා ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම සඳහා යයි ප්‍රකාශ කරමින් හෙද නිලධාරිනියන්ගෙන් ඊසි කෑෂ් ක්‍රමය මගින් මුදල් ලබා ගැනීමට ක්‍රියා කරන බව ද වාර්තා වී ඇත. මෙම වංචාකාර පුද්ගලයාට මුදල් හෝ තොරතුරුලබා නොදෙන ලෙසටත්, කිසිදු ස්ථානමාරුවලට අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මෙම අමාත්‍යාංශ විසින් කිසිදු මුදලක් අය නොකරන බවටත්, සියළුම හෙද නිලධාරීන්/ නිලධාරිනියන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

වැ.බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය ලාල් පනාපිටිය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

පිටපත් -

01. සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු - පළාත් සෞඛ්‍ය සේවයට අයත් සියළුම රෝහල් ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කිරීමට